# පුරාණ විල්ගමු රජමහා විහාරය ආශ්‍රිත ටැම්පිට විහාරය පිළිබඳ අධ්‍යයනයක්

**ගිම්හානි ඩී.ඩී.බී.**[1]

ගාල්ල දිස්ත්‍රික්කයේ වඳුරඹ මාබොටුවන ග්‍රාමයේ පිහිටි ශ්‍රී සුමනාරාම පුරාණ විල්ගමු රජමහා විහාරය ක්‍රිස්තු වර්ෂ 1240ට පමණ අයත් යැයි සෙනරත් පරණවිතානයන්ගේ නිර්දේශයට අනුව සැලකේ. දඹදෙණි යුගයේ දෙවැනි පණ්ඩිත පරාක්‍රමබාහු රජ දවස දේවපතිරාජ ඇමතිවරයාගේ මූලිකත්වයෙන් දකුණු පළාතේ කරවූ ටැම්පිට විහාර ත්‍රිත්වය අතරෙහි වූ සුවිශේෂී විහාර කර්මාන්තයක් ලෙස මෙය හඳුනාගනී. ස්ථානීය ගවේෂණ ක්‍රමය තුළ විහාර පරිශ්‍රය අධ්‍යයනය කරන ලද අතර ඊට අමතරව විහාරාධිපති ස්වාමීන් වහන්සේ සමඟ සාකච්ඡා කර දත්ත ඒකරාශී කර ගැනීම හා ඡායාරූපකරණය හරහා දත්ත වාර්තාකරණය සිදු කෙරුණි. කළුගල් 09ක් සහ සක්ක ගලක් උපකාරයෙන් තිරස් හා සිරස් නා කඳන් මත අඟල් තුනක ඝනකමින් යුත් නා ලෑලි අතුරා හුඹස් මැටි බදමයෙන් වරිච්චි බිත්ති බැඳි විහාරයේ දැවමය පිවිසුම් උළුවස්ස, සමන්මල් ලියවැලකින් අලංකෘත වන අතර සම්පූර්ණ උළුවහු කොටස් සතර ම එක්කර තිබීම වැදගත් ය. දෙරටුවෙහි ද කලාත්මක මල් ලියකම් ව්‍යාප්තිත ය. කර්ම විපාක සංකල්පය ප්‍රකට චුල්ල ධර්මපාල ජාතකය පිටත බිත්ති සතර මත සිතුවම් කර ඇත. මෝස්තර අල්ප සරල මකර තොරණ මධ්‍යයෙහි මෛත්‍රී බෝසතුන්ගේ ප්‍රතිමාවකි. සෙසු ටැම්පිට විහාරවල සමාධි ප්‍රතිමා වුව ද මෙහි අඩි 12ක් පමණ උසකින් යුත් හිටි බුද්ධ ප්‍රතිමා ත්‍රිත්වයක් පැවතීම විශේෂත්වයකි. උසින් වැඩි ම ප්‍රධාන බුද්ධ ප්‍රතිමාවෙහි වම් හා දකුණු පසින් අන් ප්‍රතිමා ද්විත්වය කරවා ඇති අතර හුඹස් මැටි, මී හා උක් පැණි මිශ්‍රිත බදමයෙන් කළ ඒවායෙහි දියරළාකාරයේ සිවුර, පාදන්තයට විහිදි බුදුරුස් මාලාව, සිරස්පත ආදී ලක්ෂණ මහනුවර යුගයේ ආභාසය හඟවයි. දැගසව් ප්‍රමුඛ රහතුන්ගේ සිතුවම් සහිත බුද්ධ මන්දිරය තුළ ම විෂ්ණු, කතරගම දේව ප්‍රතිමා ද සුමන සමන්, ඝන දෙවිවරුන්ගේ සිතුවම් ද දැකගත හැකි අතර සියුම් මෝස්තර සහිත වස්ත්‍රාභරණයන්ගෙන් සමලංකෘත වීම සුවිශේෂිත ය. එමඟින් බුද්ධ වන්දනය හා දේව වන්දනය සම තැන්හිලා සැලකුවේ ද යන්න සංශයාත්මක ය. විහාර සිතුකම් තුළ වන හොරණෑකරුගේ සිතුවම දුර්ලභ වූවක් බව පූර්ව පර්යේෂකයන්ගේ අදහස යි. ජ්‍යාමිතික නෙලුම් මල් හා ලියවැල් මඟින් වියන් තලය පූරණය කර ඇත. උක්ත සමස්ත කලා ලක්ෂණ හා වැදගත්කම් මත සුවිශේෂී ඓතිහාසික විහාරස්ථානයක් වශයෙන් පුරාණ විල්ගමු රජමහා ටැම්පිට විහාරය ඇගයිය හැකි ය.

**මුඛ්‍ය පද :** ටැම්පිට විහාරය, හිටි බුද්ධ/දේව ප්‍රතිමා, හොරණෑකරු

[1]පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. bhagyagimhani@06gmail.com